# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1907/73 - 2015 මාර්තු මස 28 වැනි සෙනසුරාදා - 2015.03.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වගන්තිය යටතේ**
**එරාවූර් නගර සභාවේ**
**සභාපති ධුරයේ පුරප්පාඩුව පිරවීම**

නැගෙනහිර පළාතේ පළාත් සභාවට තේරී පත්වීම හේතු කොටගෙන එරාවූර් නගර සභාවේ සභාපති ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 65අ(1) වන වගන්තිය යටතේ තනතුර දැරූ සභාපති වන අලි සාහිර් මවුලානා සෙයියද් අයත් වන්නා වූ එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත සභාපති වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් වන්නා වූ ද, ඒ එරාවූර් නගර සභාවේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා මොහමඩ් ඉස්මායිල් මොහමඩ් තස්ලීම් මහතා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

එරාවූර් නගර සභාවේ තේරීම් භාර නිලධාරී අබ්දුල් මජීදු මහම්මදු කබීර් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(1) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මොහමඩ් ඉස්මායිල් මොහමඩ් තස්ලීම් මහතා එරාවූර් නගර සභාවේ සභාපති වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. එම්. එම්. කබීර්,
තේරීම් භාර නිලධාරී,
එරාවූර් නගර සභාව.

2015 මාර්තු මස 27 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

04 - 458

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල
පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත
(262 වන අධිකාරය වූ)
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ
පුත්තලම නගර සභාවේ
සභික ධූරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතු කොට ගෙන පුත්තලම නගර සභාවේ සභික ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

2007 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත 65අ(2) වන වගන්තිය යටතේ ප්‍රතිපාදන සලසා ඇති පරිදි එස්. ආර්. එම්. එම්. මුහුසි නම් වූ සභිකයා අයත් වන ස්වාධීන කණ්ඩායම් අංක 8හි නායකයාට දින තිහක (30) කාල පරිච්ඡේදයක් ඇතුළත පුත්තලම නගර සභාවේ සභිකයකු වශයෙන් පත්කිරීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු වන මොහමඩ් රිස්වාන් සාබාර් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

පුත්තලම නගර සභාවේ තේරීම් භාර නිලධාරි පාක්‍යරාජා රගුනාදන් වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2)(ආ) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, මොහමඩ් රිස්වාන් සාබාර් මහතා පුත්තලම නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පාක්‍යරාජා රගුනාදන්,
තේරීම් භාර නිලධාරී,
පුත්තලම නගර සභාව.

2015 මාර්තු මස 27 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
පුත්තලම.

04 - 459

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.